
ලෝක වාර්තා පිහිටුවීම පිළිබඳවත් එබඳුම වාර්තාවක් තබා ඇති ශ්‍රී ලංකාවේ නවතම නිර්මාණය ඉදිරිපත් කරන්නේද දේශපාලන පිටියේ ලෝක වාර්තා කිහිපයක්ම තබා ඇති අගමැති රනිල් වික්‍රමසිංහ මැතිතුමා ය.

දැනට දශක හතරක පහකට උඩදී එතුමා විසින් පවත්වාගෙන යන ලද බටලන්ද කේන්ද්‍රයට සමාන වූවක් නොවූ මේ කියන කේන්ද්‍රය ප්‍රේමදාස අගමැතිතුමා විසින්

වත්මන් සිරිලංකා දේශපාලන පිටිය තුළ දක්නට ඇති තවත් විශේෂතා දෙකක් ඇත. එකක් මින් පෙර කිසි දිනෙක දක්නට නොතිබූ ආකාරයේ විරෝධතා ප්‍රදර්ශනය හා උද්ඝෝෂණ අද දවසේ එදිනෙදා සිදුවන දෛනික කාර්යයක් - දෛනික සන්දර්ශනයක් බවට පත්ව තිබීම ය. දෙක ඊටත් වඩා වැදගත් වන්නකි. අතන මෙතන කෑ කෝ ගහන කොච්චර මිනිසුන් සිටියත් ඒවා ගැන සොයා බලා පිළියමක් යෙදීමට තරම්

උවන්දිරම් ගැන සොයා බැලීමට ඉඩක් වේලාවක් ඇද්ද? ඒ බව වටහා ගැනීමට ඔය කවුරුත් සමත්විය යුත්තෝය.

තවත් කාරණාවක් - පාර්ලිමේන්තුවට ආ පසු කළ යුතු රාජකාරි ගැනත් කිව යුතු ය. හරියට දිවා භෝජනය වෙලාවට




# විරෝධතා කේන්ද්‍රය



අරලිය ගහ මන්දිරය ජේන මානයේ පිහිටවනු ලැබූ ග්‍රාමෝදය කේන්ද්‍රයට තරමක් සමාන වූවකි.

දෙක අතර පවත්නා වෙනස සමානකමට වඩා බෙහෙවින් බරපතළ වූවකි. බටලන්දට නම් තරමක සමීප බවක් නව කේන්ද්‍රයට ඇත. එහෙත් බටලන්දට වඩා මෙතැන ප්‍රජාතාන්ත්‍රික ස්වරූපයක් තිබීමට ද ඉඩ ඇත. අරක තනිකර ඒකාධිපති පාලනයක් යටතේ විශේෂ කාර්ය මණ්ඩලයක් විසින් ක්‍රියාත්මක කරන ලද අතර මේ කියන එක ක්‍රියාවට නැංවීම එහි රැස්වන පිරිස සතු වගකීමක් වනු ඇත.

දැනට අභාවප්‍රාප්ත වී කලක් ගත වුණු ගාල්ලේ පච ගහ යට තවමත් නිරුපද්‍රිතව පවත්නා ලන්ඩන් නුවර හයිඩ් උද්‍යානයේ කතාකාරයන්ගේ කතාමුල්ලටත් සමාන වූ මේ නව කේන්ද්‍රය අවශ්‍ය යයි රජයත් එහි එක් බලකණුවක් වන අගමැතිතුමාත් තීරණය කිරීමට ගත්තා වූ සාධක කවරේදැයි විමසා බැලීම ජාතියේත් දේශයේත් අනාගත අභිවෘද්ධිය ප්‍රාර්ථනා කරන කාගේත් යුතුකමකි. වගකීමකි. එක කරුණක් නම් නිසැකවම කිව හැකිය. දහනායක මහතාගේ ජය බිමක්ව පැවති ගාල්ලේ පච ගහ යට හෝ පැරණි වාමාංශික නායකයන් කිහිප දෙනකුට පුරුදු තැනක් වූ ලන්ඩන් කතාමුල්ල හෝ ප්‍රයෝජනයට ගත් හෝ ඒ දෙතැනින් එකකටවත් කර පොවා බැලූ හෝ කිසිවෙක් අද ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව තුළ නැත. එබන්දන්ගේ යුගය හමාර වී දැනට කලක් ගත වී ඇත. දැන් සිටින නායකයන් හා නවකයන්ද අලුත් ක්‍රම ගැන සිතීම පුදුමයක් නොවන්නේද ඒ නිසාම ය.

විවේකයක් - පහසුවක් හෝ ඉවසීමක් අද දියවන්නාවට පැමිණෙන දේශපාලකයන් කිසිවකුට නැත. ඒ ඇයි කියා අසන්නකුට දීමට මා ළඟ ඇති පිළිතුර දිග ය.

ඒ දිග පිළිතුර හැකි තරම් කෙටි කර කීමට මම උත්සාහ ගන්නෙමි.

මා දන්නා තරමින් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මහජන නියෝජිතයන් වශයෙන් පෙනී සිටින පිරිස ගණනින් 250ක් පමණ වෙති. ඒ අතුරින් අඩක් පමණ මෙකී නොකී වයිවාරන්න විෂය භාර ඇමතිවරුන් හෝ නියෝජ්‍ය ඇමතිවරුන්

භෝජනාගාරයට යාම සහ එහිදී දෙනු ලබන සැහැල්ලු ආහාරය භුක්තිවිඳීම දෛනික රාජකාරියට අයත් වැදගත් කොටසකි. ඔවුන්ට සපයන ආහාර වේල ඉස්තරම් එකක් බවත් එය ඉතා අඩු මුදලකට දෙන බවත් කියතත් එහි ඇත්ත නැත්ත නොදන්නා මට නිච්චියටම යමක් කිව නොහැකිය. ගාලු මුවදොර තිබුණු පරණ රාජ්‍ය මන්ත්‍රණ සභාවේ භෝජනාගාරයෙන් සහ දියවන්නා පාර්ලිමේන්තු භෝජනාගාරයෙන්ද මගේ හිතවත් මන්ත්‍රීවරුන්ගේ පිහිටෙන් කෑම වේලක් අනුභව කොට ඇති මට ඒ දෙකේම රස ගැන හරියට මතකක් නැත. මගේ අංකුර

**වසරකට වතාවක් වත් විදේශ සංචාරයක නිරතවීමද දේශපාලකයකුගේ අත්දැකීම් හා දැනුම වර්ධනය කර ගැනීමට අත්‍යවශ්‍ය බව දන්නා අයද විරල ය. වරද දේශපාලකයන්ගේ නොවන බව කිව යුතුය. මේ ආකාරයට තමන්ගේ වටිනා කාලය ඉතා වැදගත් ජනතා හා පුද්ගලික රාජකාරි වෙනුවෙන් කැප කරන දේශපාලකයන්ට රටේ නොයෙකුත් තැන්වල සිදුවන අක්‍රමිකතා හෝ ජනතා දුක් ගැනවිලි හෝ සොයා බැලීමට ඉඩක් නොතිබීම පුදුමයක් නොවේ.**

වීම ද ශ්‍රී ලංකාවට ගෞරවයක් හා ලෝක වාර්තාවක් ලබා දෙන තවත් සාධකයකි. අපි ශිෂ්‍යයන්ව සිටිය දී ලංකාවේ මන්ත්‍රණ සභාවේ සිටි ඇමතිවරුන්ගේ නම් හා ඔවුන්ගේ අමාත්‍යංශ මොනවාද යන්නත් කට පාඩමින් කීමට සමත්වීමු. අද ඔය දෙකින් එකක් වත් පොතක් නොබලා කීමට සමත් ජගතෙක් මිහිපිට නැත. ඒ කරුණම මගේ පිළිතුරට පදනම සපයන්නේ ය. මේ වාගේ වංක ගිරියක කරක් ගහන මැති ඇමති පිරිසට අතන මෙතන කෙඳිරිගාන අරකාගේ මේකාගේ

මන්ත්‍රීවරුන් දෙනොම හොඳට වැඩුණු සිරුරු සහිතව සිටි බව පමණක් මට මතක ය.

ඊ ළඟට මැති සබය තුළට ගොස් විනාඩි පහක් වත් වාඩි වී සිටිය යුතුය. පැමිණීම වෙනුවෙන් ගෙවනු ලබන දීමනාව වූ රුපියල් 2500 ලැබීමට එය අවශ්‍යම වන නිසා ය. කතා කිරීම හෝ නොකිරීම සුදුසු පරිදි තීරණය කළ යුතු දෙයක් මිස අත්‍යවශ්‍ය රාජකාරියක් නොවේ.

මැති ඇමතිවරුන්ගේ රාජකාරිය පාර්ලිමේන්තුවට හෝ ඇමති කාර්යාලයට සීමාවූවක් යයි සිතන බොහෝ දෙනා ඔවුන් පිට පැවරී ඇති බරපතළ වගකීම් ගැන කිසිම අවබෝධයක් නොමැති විවේචකයෝ ය. කොටින්ම ඇඳ කුඳ සෙවීමට පුරුදු වූ නිකම්මු ය. නොබෝ දා පත්තරයක පුවතක් පළ කර තිබුණේ "බොරු කෝ?" යන උප සිරස්තලයද සහිතවය. ඒ ජාතික වීරයන්ට සම්මාන පිරිනැමීමේ උත්සවයක් ගැන කියන පුවතකි. පාසල් සිසුන්ට - ගුරුවරුන්ට - හෙදියන්ට - වින්නඹුවන්ට - වෛද්‍යවරුන්ට - විද්‍යාඥයන්ට - පුවත්පත් කලාවේදීන්ට - නලුවන්ට හා නිළියන්ට - ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම ඔස්ට්‍රේලියාව බලා යන විට ඔවුන් පිටත් කිරීම සඳහා චතුරිකා නම් වූ කාන්තාවකට ලක්ෂ ගණනක් ගෙවා ලබාගත් නලු පිරිසක් ආවඩන නැටුම් ඉදිරිපත් කළ බවද පසුගියදා වාර්තා විය. ව්‍යාපාරිකයන්ට නව නිෂ්පාදන ඉදිරිපත් කරන්නන්ට - රණ විරුවන්ට - තවත් බොහෝ වීරයන්ට උපහාර දීමේ ඔවුන් පිළිගැනීමේ උත්සව කීයකට නම් එක් පුද්ගලයෙක් යා යුත්තේද? ඒ කිසිවක් මග හැරීම කලත් රැකියාව රැක ගැනීමට හිතන කිසිවෙක් නොකරති.

නව විවෘත කිරීමේ උත්සව කීයක් තමාගේ ප්‍රදේශයේ පවත්වනවා ඇද්ද? විවෘත කිරීමට ජනපති හෝ ඇමති එනවා නම් එය මග හළ නොහැකිය. ඒ උළෙලකට ගොස් ගත කරන කාලය කොතරම් වටිනවාදැයි දන්නා කෙනෙක් ඔවුන්ට දොසක් නොකියති.

මංගල හා අවමංගල උත්සව කිසිවක් මගහැරීමද උගහටය. දෙකටම නොගියොත් වැරදි හොයන පිරිස අනන්තය. රන්ජන් රාමනායක වැනි නලුවකු කෙසේ කීවත් මේ වාගේ ජනතාව අගය කොට සළකන අවස්ථා මග හැරීම සිංහල බෞද්ධ දේශපාලකයන්ට සුදුසු නොවේ.

බොහෝ වූ පරාර්ථය නිසා ආත්මාර්ථය නොතකා හළ යුතු නැත යන බුදු වදන ශ්‍රී ලාංකික දේශපාලකයන්ට හොඳට මතක තිබේ. සිය අඹුදරුවන් හා ඥාතීන් ගැන සොයා බලා අවශ්‍ය සංග්‍රහ කිරීමට පසුබට වන කිසිවෙක් ඒ අතර නැත . ඔවුන්ගේ ගමන් බිමන් සුඛ විහරණය සොයන අතරම තමාගේ සුඛ විහරණය නොවීමද ඒ තරමට ම වැදගත් ය. තමාට ලැබෙන නිල රථය හා කාර්යාල සේවා පහසුකම් යනාදී

14 වන පිටට